# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 ජනවාරි මස 05 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2024.01.09 දින නිකුත් කරන ලදී)**

## දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)

**(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 24.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් පනත් කෙටුම්පතේ උපලේඛනයේ දැක්වෙන (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ ඇතැම් වගන්ති සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තිවල නීතිය බලපෑම වනුයේ අදාළ වැරදි සම්බන්ධයෙන් පනවා ඇති දඩ මුදල් වැඩි කිරීම වේ.

## දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)

එල්.ඩී.-ඕ. 45/2019

### (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2024 අංක    දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති, 19 වන අධිකාරයේ ඇතැම් වගන්ති සංශෝධනය කිරීම*

**2.** මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති, එම උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වැරදිවලට අදාළව පනවා ඇති දණ්ඩන ඉහළ නැංවීමේ කාර්යය සඳහා, එම උපලේඛනයේ III වන තීරයේ අනුරූපී සටහන්වල නිශ්චිතව දක්වා ඇති වචන වෙනුවට එහි IV වන තීරයේ අනුරූපී සටහන්වල නිශ්චිතව දක්වා ඇති වචන ආදේශ කිරීම මගින්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*සැක දුරුකිරීම*

**3.** සැක දුරුකිරීම සඳහා, මෙහි උපලේඛනයේ දක්වා ඇති වරදක් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව සිදු කර ඇති අවස්ථාවක එවැනි වරදක් සම්බන්ධයෙන් 2 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය (2 වන වගන්තිය)

| I තීරය | II තීරය | III තීරය | IV තීරය |
|---|---|---|---|
| වගන්තිය | වරද | දැනට යෙදෙන වචන | සංශෝධිත වචන |
| 137 | තමා සෙබළකු, නාවික භටයකු හෝ ගුවන් භටයකු බව විශ්වාස කරවීමේ අදහසින් එබඳු සෙබළකුගේ, නාවික භටයකුගේ හෝ ගුවන් භටයකුගේ ඇඳුමක් ඇඳීම හෝ එබන්දකු පාවිච්චි කරන යම් සලකුණක් ගෙන යෑම | රුපියල් සියයක් | රුපියල් පනස්දහසක් |
| 151 | කැරලි ගැසීම ආදිය පිළිබඳව ඉඩම් හිමියා හෝ පදිංචිකරු තොරතුරු නොදීම | රුපියල් දහසක් | රුපියල් දසදහසක් |
| 157 | කලහ කිරීම | රුපියල් සියයක් | රුපියල් දසදහසක් |
| 165 | තැපැල් හෝ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත රජයේ සේවකයකු විසින් කරනු ලබන විෂමාචාරය | රුපියල් පනහක් | රුපියල් විසිදහසක් |
| 169 | රජයේ සේවකයකු විසින් පාවිච්චි කරනු ලබන ඇඳුම් හෝ සලකුණු වංචනික චේතනාවෙන් ඇඳීම හෝ පාවිච්චි කිරීම | රුපියල් සියයක් | රුපියල් විසිපන් දහසක් |
| 169ඉ | ඡන්ද විමසීමක් සම්බන්ධ අල්ලස් දීම | රුපියල් පන්සියයක් | රුපියල් මිලියනයක් |
| | සංග්‍රහ කිරීමෙන් අල්ලස් දීමක් නම් | රුපියල් දෙසීයයක් | රුපියල් හත් ලක්ෂ පනස් දහසක් |
| 169ඊ | ඡන්ද විමසීමක දී අයුතු බලපෑම | රුපියල් පන්සියයක් | රුපියල් ලක්ෂයක් |
| | ඡන්ද විමසීමක දී අන්‍යයකුගේ නාමයෙන් පෙනී සිටීම | රුපියල් තුන්සියයක් | රුපියල් ලක්ෂයක් |

| | | | |
|---|---|---|---|
| 169ඉඉ | ඡන්ද විමසීමක ගණන් හිලව් තැබීම පැහැර හැරීම | රුපියල් තුන්සියයක් | රුපියල් ලක්ෂයක් |
| 170 | රජයේ සේවකයකු විසින් සිතාසි හෝ වෙනත් නියමයන් භාරදෙනු ලැබීම වැළැක්වීම සඳහා පැන ගොස් සැඟවී සිටීම | රුපියල් පනහක් | රුපියල් පනස් දහසක් |
| | අධිකරණයක පුද්ගලිකව පෙනී සිටීම ආදිය සඳහා සිතාසියකින් හෝ දැන්වීමකින් නියම කර ඇත්නම් | රුපියල් සියයක් | රුපියල් පනස් දහසක් |
| 171 | යම් සිතාසියක් හෝ දැන්වීමක් භාර දීම හෝ ඇලවීම වැළැක්වීම නැතහොත් එය ඇලවූ විට එය ඉවත් කිරීම හෝ ප්‍රකාශනයක් කිරීම වැළැක්වීම | මාසයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතල වැඩ නැති බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පනහක් දක්වා විය හැකි දඩයකින් | මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතල වැඩ නැති බන්ධනාගාර ගත කිරීමකින් හෝ රුපියල් විසිදහසක් දක්වා විය හැකි දඩයකින් |
| | අධිකරණයක පුද්ගලිකව පෙනී සිටීම ආදිය සඳහා සිතාසි ආදියෙන් නියම කර ඇත්නම් | රුපියල් සියයක් | රුපියල් පනස් දහසක් |
| 172 | තමා ම හෝ නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ යම් ස්ථානයක පෙනී සිටිය යුතු ය, යන නීත්‍යනුකූල නියමයකට අකීකරු වීම හෝ බලය නොමැතිව එතැනින් පිටවීම | මාසයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතල වැඩ නැති බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පනහක් දක්වා විය හැකි දඩයකින් | මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතල වැඩ නැති බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් විසිදහසක් දක්වා විය හැකි දඩයකින් |
| | අධිකරණයක පෞද්ගලිකව පෙනී සිටීම ආදිය නියමය අනුව අවශ්‍ය වේ නම් | රුපියල් සියයක් | රුපියල් පනස් දහසක් |

| | | | |
|---|---|---|---|
| 173 | ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ භාර කරවීමට නීත්‍යානුකූලව බැඳී ඇති තැනැත්තකු විසින් එය රජයේ සේවකයකු වෙත ඕනෑකමින් ඉදිරිපත් කිරීම පැහැර හැරීම | මාසයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතල වැඩ නැති බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පනහක් දක්වා විය හැකි දඩයකින් | මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතල වැඩ නැති බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් විසිදහසක් දක්වා විය හැකි දඩයකින් |
| | ලේඛනය අධිකරණයකට ඉදිරිපත් කළ යුතු යැයි හෝ භාර කළ යුතු යැයි නියම ව ඇතොත් | රුපියල් සියයක් | රුපියල් පනස් දහසක් |
| 174 | දැනුම් දීමට හෝ තොරතුරු සැපයීමට නිතනුකූලව බැඳී ඇති තැනැත්තකු විසින් රජයේ සේවකයකු වෙත ඒ දැනුම්දීම හෝ තොරතුරු සැපයීම ඕනෑකමින් ම පැහැර හැරීම | මාසයක් දක්වා දීර්ඝ විය හැකි කාලයක බරපතල වැඩ නැති බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පනහක් දක්වා විය හැකි දඩයකින් | මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතල වැඩ නැති බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් විසිදහසක් දක්වා විය හැකි දඩයකින් |
| | අවශ්‍ය වූ දැනුම් දීම හෝ තොරතුරු වරදක් කිරීම ආදිය පිළිබඳව නම් | රුපියල් සියයක් | රුපියල් පනස් දහසක් |

| | | | |
|---|---|---|---|
| 175 | රජයේ සේවකයකුට දැනුවත්ව අසත්‍යය තොරතුරු සැපයීම | රුපියල් සියයක් | රුපියල් පනස් දහසක් |
| 176 | රජයේ සේවකයකු විසින් දිවුරුම් දීමට යථා පරිදි නියම කරනු ලැබූ විට දිවුරුම් දීම ප්‍රතික්ෂේප කිරීම | රුපියල් සියයක් | රුපියල් පනස් දහසක් |
| 177 | සත්‍යය ප්‍රකාශ කිරීමට නීත්‍යානුකූලව බැඳී ඇති විටක දී ප්‍රශ්නවලට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීම | රුපියල් සියයක් | රුපියල් පනස් දහසක් |
| 178 | රජයේ සේවකයකුට කරන ලද ප්‍රකාශයකට අත්සන් තැබීමට නීත්‍යානුකූලව නියමිතව ඇති විටක දී එසේ අත්සන් තැබීම ප්‍රතික්ෂේප කිරීම | රුපියල් සියයක් | රුපියල් විසිදහසක් |
| 180 | යම් තැනැත්තකු හානියට හෝ හිරිහැරයට පත්වන පරිදි රජයේ සේවකයකු ලවා තමා නීත්‍යානුකූල බලය පාවිච්චි කරවනු පිණිස එම රජයේ සේවකයාට අසත්‍යය තොරතුරු සැපයීම | රුපියල් එක්දහසක් | රුපියල් ලක්ෂයක් |
| 181 | රජයේ සේවකයකුගේ නීත්‍යානුකූල බලය පිට දේපළක් ගැනීමට විරුද්ධ වීම | රුපියල් එක්සියයක් | රුපියල් පනස් දහසක් |
| 182 | රජයේ සේවකයකුගේ බලය පිට විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ දේපළ විකිණීමකට බාධා කිරීම | මාසයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් එක් සියයක් දක්වා විය හැකි දඩයකින් | මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතල වැඩ නැති බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් විසි දහසක් දක්වා විය හැකි දඩයකින් |

| | | | |
|---|---|---|---|
| 183 | රාජකාරී කටයුතු ඉටුකිරීමේ දී රජයේ සේවකයකුට බාධා කිරීම | මාස තුනක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් එක් සියයක් දක්වා විය හැකි දඩයකින් | මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතල වැඩ නැති බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් විසිපන්දහසක් දක්වා විය හැකි දඩයකින් |
| 184 | සහාය වීමට නීතියෙන් බැඳී ඇති විට රජයේ සේවකයකුට සහාය වීම නොකර හැරීම | මාසයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතල වැඩ නැති බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පනහක් දක්වා විය හැකි දඩයකින් | මාස තුනක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතල වැඩ නැති බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් විසිදහසක් දක්වා විය හැකි දඩයකින් |
| | කැඳවීම් නියෝග භාරදීම්, අපරාධ වැළැක්වීම ආදියේ දී රජයේ සේවකයකු උපකාර ඉල්ලා සිටි විටක ඔහුට සහාය වීම ඕනෑකමින් ම නොසළකා හැරීම | රුපියල් එක්සියයක් | රුපියල් ලක්ෂයක් |

| | | | |
|---|---|---|---|
| 185 | රජයේ සේවකයකු විසින් නීත්‍යනුකූලව ප්‍රඥාපනය කරන ලද නියමයකට අකීකරු වීමෙන්, නීත්‍යනුකූල ව සේවයෙහි යොදවනු ලබන තැනැත්තන් හට බාධාවක්, කරදරයක් හෝ හානියක් සිදුවේ නම් එබඳු අකීකරු වීම | මාසයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතල වැඩ නැති බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පනහක් දක්වා විය හැකි දඩයකින් | මාස තුනක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතල වැඩ නැති බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් විසිදහසක් දක්වා විය හැකි දඩයකින් |
| | එබඳු අකීකරු වීමෙන් මනුෂ්‍ය ජීවිතයට, සෞඛ්‍යයට හෝ ආරක්ෂාව ආදියට අන්තරායක් වෙතොත් | මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියයක් දක්වා විය හැකි දඩයකින් | මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතල වැඩ නැති බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පනස් දහසක් දක්වා විය හැකි දඩයකින් |
| 219අ | සිවිල් කැඳවීම් නියෝගයක් යටතේ කරනු ලබන නීත්‍යනුකූල අල්ලස් ගැනීමකට ප්‍රතිරෝධය පෑම හෝ ඊට බාධා කිරීම | රුපියල් සියයක් | රුපියල් විසිදහසක් |
| 223 | රජයේ සේවකයකු අධිකරණමය කටයුත්තක යම් අවස්ථාවක යෙදී සිටිත් දී චේතනාන්විතව ම ඔහුට නින්දා කිරීම හෝ බාධා කිරීම | රුපියල් දහසක් | රුපියල් පනස් දහසක් |
| 265 | විකිණීමට අදහස් කරනු ලැබූ ආහාර හෝ පාන අහිතකර වන පරිද්දෙන් අපමිශ්‍ර කිරීම | රුපියල් සියයක් | රුපියල් ලක්ෂයක් |
| 266 | ආහාර හෝ පාන අහිතකර බව දැනගෙන ම ඒවා ආහාර සහ පාන වශයෙන් විකිණීම | රුපියල් සියයක් | රුපියල් ලක්ෂයක් |

| | | | |
|---|---|---|---|
| 267 | විකිණීමට අදහස් කරනු ලැබූ යම් බෙහෙතක් හෝ ඖෂධ සංයෝගයක් එහි ගුණය අඩු වන පරිදි හෝ එහි ක්‍රියාකාරිත්වය අඩු වන පරිදි හෝ එය අහිතකර වන පරිදි අපමිශ්‍ර කිරීම | රුපියල් සියයක් | රුපියල් ලක්ෂයක් |
| 268 | අපමිශ්‍ර කරනු ලැබූ බව දන්නා යම් බෙහෙතක් හෝ ඖෂධ සංයෝගයක් විකිණීම සඳහා තැබීම හෝ බෙහෙත් ශාලාවකින් නිකුත් කිරීම | රුපියල් සියයක් | රුපියල් ලක්ෂයක් |
| 269 | යම් බෙහෙතක් හෝ ඖෂධ සංයෝගයක් වෙනස් බෙහෙතක් හෝ ඖෂධ සංයෝගයක් වශයෙන් දැනගෙනම විකිණීම හෝ බෙහෙත් ශාලාවකින් නිකුත් කිරීම | රුපියල් සියයක් | රුපියල් ලක්ෂයක් |
| 270 | පොදු උල්පතක හෝ ජලාශයක ජලය අපවිත්‍ර කිරීම | මාස තුනක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් පනහක් දක්වා විය හැකි දඩයකින් | මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතල වැඩ නැති බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් ලක්ෂයක් දක්වා විය හැකි දඩයකින් |
| 271 | පරිසරය සෞඛ්‍යයට අහිතකර කිරීම | රුපියල් සියයක් | රුපියල් ලක්ෂයක් |

| | | | |
|---|---|---|---|
| 272 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරාදායක වන පරිදි අපරික්ෂාකාරී ලෙස හෝ නොසැලකිලිමත් ලෙස මහා මාර්ගයක වාහන පැදවීම හෝ සතකු පිට යෑම | මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ රුපියල් සියයක් දක්වා විය හැකි දඩයකින් හෝ ඒ දඬුවම් දෙකින් ම හෝ | රුපියල් විසිපන්දහසකට නොඅඩු වන්නා වූ ද රුපියල් පනස්දහසක් නොඉක්මවන්නා වූ ද දඩයක් ද, දෙවන වරට වරදකරු කරනු ලැබීමක දී රුපියල් තිස්දහසකට නොඅඩු වන්නා වූ ද රුපියල් හැත්තෑපන්දහසක් නොඉක්මවන්නා වූ ද දඩයකින් සහ ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවීමෙන් ද තෙවන වරට හෝ තදනන්තර වරදකරු කරනු ලැබීමක දී රුපියල් හැත්තෑ පන්දහසකට නොඅඩු වන්නා වූ දඩයකින් හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බරපතල වැඩ ඇති බන්ධනාගාරගත කිරීමකින් හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකින් ම සහ ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කිරීමෙන් ද |

| | | | |
|---|---|---|---|
| 273 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරායදායක වන පරිදි අපරීක්ෂාකාරී ලෙස හෝ නොසැලකිලිමත් ලෙස යම් යාත්‍රාවක් යාත්‍රා කරවීම | රුපියල් සියයක් | රුපියල් පනස් දහසක් |
| 275 | තැනැත්තකුගේ ජීවිතයට අන්තරායදායක වන තත්ත්වයක පවතින හෝ එසේ මගීන් පටවනු ලැබූ යාත්‍රාවකින් යම් තැනැත්තකු කුලියට ජලයෙන් ගෙන යෑම | රුපියල් සියයක් | රුපියල් පනස් දහසක් |
| 276 | යම් මහාමාර්ගයකට හෝ යාත්‍රා මාර්ගයකට අන්තරායක්, බාධකයක් හෝ හානියක් සිදු කිරීම | රුපියල් සියයක් දක්වා විය හැකි දඩයකින් | රුපියල් පනස් දහසක් දක්වා විය හැකි දඩයකින් |
| 277 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරායදායක වන පරිදි යම් විෂ ද්‍රව්‍යයන් පිළිබඳව කටයුතු කිරීම | රුපියල් සියයක් | රුපියල් පනස් දහසක් |
| 278 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරායදායක වන පරිදි ගින්දර හෝ යම් ඇවිලෙනසුලු ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් කටයුතු කිරීම | රුපියල් සියයක් | රුපියල් පනස් දහසක් |
| 279 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරායදායක වන පරිදි යම් පුපුරණ ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් කටයුතු කිරීම | රුපියල් සියයක් | රුපියල් හැත්තෑ පන්දහසක් |
| 280 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරායදායක වන පරිදි යම් යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් කටයුතු කිරීම | රුපියල් සියයක් | රුපියල් පනස් දහසක් |

| | | | |
|---|---|---|---|
| 281 | බිඳ හෙලීමට හෝ අලුත්වැඩියා කිරීමට තමාට අයිතිය ඇති යම් ගොඩනැගිල්ලක් කඩා වැටීමෙන් මනුෂ්‍ය ජීවිතයට අන්තරායක් විය හැකි නම්, යම් තැනැත්තකු එම අන්තරාය වැළැක්වීමට ආරක්ෂා කටයුතු යෙදීම පැහැර හැරීම | රුපියල් සියයක් | රුපියල් පනස් දහසක් |
| 282 | තමා සන්තකයෙහි සිටින යම් සතකුගෙන් මනුෂ්‍ය ජීවිතයට වන අන්තරායක් හෝ බරපතල තුවාලයක් වැළැක්වෙන පරිදි ඒ සතා රැක බලා ගැනීම පැහැර හැරීම | රුපියල් සියයක් | රුපියල් විසි දහසක් |
| 283 | මහජන කරදරයක් සිදු කිරීම | රුපියල් පනහක් | රුපියල් විසිදහසක් |
| 314 | ස්වේච්ඡාවෙන් ම තුවාල සිදු කිරීම | රුපියල් දහසක් | රුපියල් පනස් දහසක් |
| 325 | ප්‍රකෝපයට පත් කළ තැනැත්තා හැර වෙනත් යම් තැනැත්තකුට තුවාල කිරීමේ චේතනාව නැතිව තදබල සහ හදිසි ප්‍රකෝපනයකින් ස්වේච්ඡාවෙන් ම තුවාල සිදු කිරීම | රුපියල් පනහක් | රුපියල් විසිදහසක් |
| 326 | ප්‍රකෝපයට පත් කළ තැනැත්තා හැර වෙනත් යම් තැනැත්තකුට තුවාල සිදු කිරීමේ චේතනාව නැතිව තදබල සහ හදිසි ප්‍රකෝපනයකින් ස්වේච්ඡාවෙන් ම බරපතල තුවාල සිදු කිරීම | රුපියල් දෙදහසක් | රුපියල් පනස් දහසක් |
| 327 | මනුෂ්‍ය ජීවිතයට හෝ වෙනත් තැනැත්තන්ගේ පෞද්ගලික ආරක්ෂාවට හෝ අන්තරායදායක වන අන්දමට සැහැසි ලෙස හෝ නොසැලකිලිමත් ලෙස යම් ක්‍රියාවක් කිරීම | රුපියල් සියයක් | රුපියල් ලක්ෂයක් |
| 328 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරායදායක වන අන්දමේ ක්‍රියාවක් සැහැසි ලෙස හෝ නොසැලකිලිමත් ලෙස හෝ කිරීමෙන් තුවාල සිදු කිරීම | රුපියල් සියයක් | රුපියල් ලක්ෂයක් |

| | | | |
|---|---|---|---|
| 329 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරායදායක වන අන්දමේ ක්‍රියාවක් සැහැසි ලෙස හෝ නොසැලකිලිමත් ලෙස හෝ කිරීමෙන් බරපතල තුවාල සිදු කිරීම | රුපියල් දහසක් | රුපියල් එක් ලක්ෂ පනස් දහසක් |
| 332 | යම් තැනැත්තකුට අයුතු ලෙස අවහිර කිරීම | රුපියල් පනහක් | රුපියල් පනස් දහසක් |
| 333 | යම් තැනැත්තකු අයුතු ලෙස සිරකර තැබීම | රුපියල් දහසක් | රුපියල් ලක්ෂ පහක් |
| 343 | තදබල සහ හදිසි ප්‍රකෝපනයකින් හැර සෙසු අවස්ථාවක දී අඩන්තේට්ටම් කිරීම හෝ සාපරාධ බලහත්කාරය පෑම | රුපියල් පනහක් | රුපියල් පනස් දහසක් |
| 348 | යම් තැනැත්තකු අයුතු ලෙස සිර කර තැබීමට තැත් කිරීමේ දී අඩන්තේට්ටම් කිරීම හෝ සාපරාධ බලහත්කාරය පෑම | රුපියල් පනහක් | රුපියල් ලක්ෂ පහක් |
| 349 | තදබල සහ හදිසි ප්‍රකෝපනයකින් අඩන්තේට්ටම් කිරීම හෝ සාපරාධ බලහත්කාරය පෑම | රුපියල් පනහක් | රුපියල් විසිදහසක් |
| 433 | සාපරාධ අයුතු ඇතුළුවීම | රුපියල් සියයක් | රුපියල් ලක්ෂයක් |
| 434 | ගෙයකට අයුතු ලෙස ඇතුළුවීම | රුපියල් දහසක් | රුපියල් එක් ලක්ෂ පනස් දහසක් |

| | | | |
|---|---|---|---|
| 450 | නීති විරෝධී කාර්යයක් සඳහා ගොඩනැගිල්ලක සිට අසුවීම | රුපියල් පනහක් | රුපියල් විසිදහසක් |
| 451 | ප්‍රකට සොරකු නිකරුණේ ගැවසීම | රුපියල් පනහක් | රුපියල් විසිදහසක් |
| 487 | නිර්නාමික සංදේශනයකින් හෝ තර්ජනය කරන්නේ කවරෙකු ද යන්න සැඟවීමට පූර්වාරක්ෂාව යෙදීමෙන් හෝ කරනු ලබන සාපරාධ භය ගැන්වීම | අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් | අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ ඒ දඬුවම් දෙකින් ම හෝ |